


# ආදර්ශවත් නායකත්වය

අතීතයේ බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනකු රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණෝ වෙළෙඳ කුලයෙක උපත ලැබූහ. වැඩි වියට පත් එතුමෝ සාත්තු නායකයකු ලෙස ගැල් පන්සියයකට නායකත්වය දෙමින් වෙළෙඳ කටයුතුවල නිරත වූහ. එතුමාට මිතුරෙක් විය. ඔහු නුවණින් අඩු ය; උපායශීලී නොවේ; අදක්ෂ ය. එක් කාලයක බෝසත් වෙළෙඳ නායකතුමා ගැල් පන්සියයක බඩු පුරවාගෙන වෙළෙඳාමේ යාමට සූදානම් විය. නුවණ මඳ පුද්ගලයා ද ගැල් පන්සියයක බඩු පුරවාගෙන එක මාර්ගයේ ම වෙළෙඳාමේ යාමට සූදානම් විය. එවිට බෝසත්තුමා මේ නුවණ නැති වෙළෙඳ නායකයාත් මා සමග යාමට සූදානම් වුව ද ගැල් දාහක් ගමන් කරන්නට මෙය සුදුසු මාර්ගයක් නොවේ. එසේ ම ගමන් කරන මිනිසුන්ට දර හා ජලය ද, ගැල් අදින ගවයන්ට තණකොළ ද සපයා ගැනීමට අසීරු වෙයි. මේ නිසා ඔහු හෝ මා හෝ පළමු ව යා යුතු යැයි සිතා ඒ අනුවණ ගැල් නායකයා කැඳවා "අප දෙදෙනාට ම එක වර ගමන් කළ නොහැකි ය. පළමු ව යන්නේ ඔබ ද මම ද" යි විමසුවේ ය. එවිට අනුවණ ගැල් නායකයා මෙසේ සිතී ය. තමා පළමු ව ගිය කල්හි බොහෝ ලාභ ප්‍රයෝජන වන්නේ ය. කරත්ත රෝදවලින් හැරුණු වළ සහිත මාර්ග නැත. කරත්ත අදිනා ගොනුන්ට ද හොඳ තණකොළ කෑමට පුළුවන. මිනිසුන්ට ද කිසිවෙකු නොකැඩූ හොඳ පලා ආදිය ලැබෙන්නේ ය. ඉතා පිරිසිදු ජලය ද ලබා ගත හැකි වන්නේ ය. තමාට කැමැති පරිදි මිල ගණන්වලට බඩු විකුණාගත හැකි වන්නේ ය. එසේ සිතා "මිත්‍රය මම පළමු ව යන්නම්," යැයි බෝසතුන්ට ප්‍රකාශ කළේ ය.

බෝසත්තුමා ද පසු ව යාමෙන් බොහෝ ප්‍රයෝජන අත්වන බව දැන මෙසේ සිතී ය. පළමු ව ගමන් ගන්නෝ මාර්ගයේ දුර්වල තැන් පිළිසකර කරති. ඔවුන් සකස් කළ මග මට ගමන් කළ හැකි ය. පළමු ව ගියහොත්

මේරූ තණකොළ ගවයන්ට කෑමට සිදුවෙයි. වරක් කෑ පසු නැවත එන ළපටි තණකොළ මගේ ගවයන්ට කෑමට හැකි වේවි. එසේ ම පළමු ව යන්නන් පලා කොළ කඩාගත් පසු නැවත දලු දමන ළපටි පලා අපගේ මිනිසුන්ට අනුභව කිරීමට හැකි වන්නේ ය. පළමු ව යන අය පැන් නොමැති වූ විට ළිං කපති. ඔවුන් කැපූ ළිංවලින් අපට ද පැන් බීමට හැකි වන්නේ ය. ඔවුන් ඉහළ මිල ගණන් නියම කර බඩු විකුණා ඇතොත් මම ද පසු ව ගොස් ඔවුන් නියම කර ඇති මිලට බඩු විකුණන්නෙමි. මෙසේ පසු ව ගමන් කිරීමේ ප්‍රයෝජන පිළිබඳ ව සිතූ බෝසතාණෝ මිතුරු ගැල් නායකයා අමතා, 'ඔබ පළමු ව යන්නැ' යි කීහ. එවිට නුවණ නැති ගැල් නායකයා සතුටු ව අහාර පාන, ජලය, දර ආදිය ගැල්වලට පටවා ගත්තේ ය. නියමිත පරිදි ගමන් ඇරඹිණි. සාත්තු නායකයා මග පෙන්වමින් ඉදිරියෙන් ම ගියේ ය. මිනිස් වාසය පසු කළ පිරිස කාන්තාරයකට පිවිසියහ. හැට යොදුනක් වූ කාන්තාරයේ අඩක් පමණ තරණය කර සිටින අතරතුර එම කාන්තාරයට අරක් ගත් එක්තරා යක්ෂයෙක් ඔවුන් කරා පැමිණියේ ය. යක්ෂ තෙමේ ගැල්කරුවන් හා ගොනුන් මරා කන්නෙමැ යි සිතා එක්තරා උපායක් යෙදී ය. හෙතෙම කාන්තාර මාර්ගයේ ඉදිරියෙන් මහ වැසි වස්නා බව මවා පෙන්නුම් කළේ ය.

කාන්තාරයට හිටි හැටියේ ඇද හැලුණු ඒ වර්ෂාව ඉතා දැඩි විය. පොළොව සාරවත් වෙයි. වැව් පොකුණු දියෙන් පිරී ඉතිරී යයි. නෙළුම් මානෙල් මල් පිපෙයි. මිනිස්සු මඩෙහි එරෙමින් ගමන් කරති. යක්ෂයා වෙළෙඳුන්ට මවා පෙන්වූයේ මෙවන් දර්ශනයකි. තෙත බරිත වූ ඇඳුම් ඇඳගත් මිනිස්සු දිය හා මඩ වගුරවමින් මඩ තැවරුණු රියකින් ගමන් කරති.



සාත්තු නායක තෙමේ මේ පිරිසගෙන් මග තොරතුරු විමසී ය. යක්ෂයා වෙළෙඳුන් අමතා ඉදිරියෙහි මහ වැසි වස්නා බව විස්තර කළේ ය. ඒ අසා හෙතෙම බෙහෙවින් සතුටට පත් විය. ඉදිරියෙහි ජලය තිබිය දී දිය බඳුන් රැගෙන යා යුතු නැතැ යි ඔහු සිතී ය. මෙතෙක් රැගෙන ආ ජලය ඉවත දමා බර අඩු කරගෙන පහසුවෙන් ගැල් පැදවීමට හෙතෙම තීරණය කළේ ය.

එහෙත් සිදු වූයේ අනෙකකි. ඉදිරියේ වැසි නොලැබිණ. දිය ස්වල්ප මාත්‍රයකුදු නොවී ය. දිය පිපාසයෙන් පීඩිත වූ මිනිස්සු ද ගොන්නු ද තැන් තැන්වල පීඩාවට පත් ව ඇද වැටුණහ. මැදියම් රැයේ පැමිණි යක්ෂයෝ ඒ මිනිසුන් හා ගවයන් මරා මස් අනුභව කළහ.

දින කිහිපයක් ගෙවී ගියේ ය. නුවණැති බෝසත් වෙළෙන්ඳා ගමනට සැරසිණි. ඔහු වඩාත් කල්පනාකාරී ව ගමන සැලසුම් කළේ ය. කාන්තාරයක් හරහා යන ගමනේ දී ජලය තීරණාත්මක සාධකය වෙයි. හෙතෙම ජල පරිහරණයේ දී බෙහෙවින් පරිස්සම් වීමට සැලකිලිමත් විය; ගමනට සෑහෙන තරමට ජලය ගැල්වලට පුරවා ගත්තේ ය. තම වෙළෙඳ කණ්ඩායම කැඳවා තම ආරක්ෂාව පිණිස විශේෂයෙන් සිත තබාගත යුතු කරුණු වෙත සියල්ලන්ගේ ම අවධානය යොමු කරවී ය.

"මා නොවිචාරා පැන් පතක් පමණකුදු නිකරුණේ ප්‍රයෝජනයට නොගනුව. මේ කතර මග විෂ වෘක්ෂ ඇත. එහෙයින් පෙර නොකෑ විරූ ඵලයක්, කොළයක්, මලක්, පලා වර්ගයක් මා නොවිචාරා නොකව," යනුවෙන් හෙතෙම අවවාද කළේ ය.

වෙළෙන්දෝ ගමනට පිටත් වූහ. ගම්බිම් කෙත්වතු පසුකොට ඔවුහු කාන්තාර මධ්‍යයට පැමිණියහ. වෙළෙඳුන් රවටා සිය වසඟයට ගැනීමට සිතූ යක්ෂයෝ මහ වැසි වස්නා ප්‍රදේශයක් පසු කොට එන පිරිසක් මෙන් තෙත් වූ වස්ත්‍රාදිය ඇති ව යළිත් වෙළෙඳුන් ඉදිරියට ආහ. වෙළෙඳුන් ඉදිරියේ වැසි වස්නා අයුරු විස්තර කළහ. එහෙත් වෙළෙඳ නායකයා ඔවුන් කී දේ නොපිළිගත්තේ ය.

සාත්තු නායකයා "පැන් දුටු තැනක දී පැන් දමාපියා, ගැල් සැහැල්ලු කොට යම්හ, " යි දැඩි අධිෂ්ඨානයෙන් ප්‍රකාශ කළේ ය. වෙළෙඳ පිරිස සාත්තු නායකයාගේ අදහසට එකඟ වූහ. යක්ෂයෝ ආ මගම ආපසු ගියහ. නැවත වෙළෙඳ පිරිස කැඳවූ සාත්තු නායකයා,

"තොප විසින් මේ කාන්තාරයෙහි විලක්වත් පොකුණක්වත් ඇතැයි කිසි කෙනකුගෙන් අසා තිබේ ද?" යනුවෙන් විචාළේ ය.
"ස්වාමීනි, එසේ අසා නැත්තෙමු."

"මේ නිල් වූ වන රොදින් එපිට වැසි වස්නේ යැයි සමහර කෙනෙක් කිවූහ. වැසි සුළඟ නම් කොතෙක් තැන් හමා ද?"
"ස්වාමීනි, යොදුනක් පමණ තැන් හමන්නේ වේදැ" යි ඔවුහු පිළිතුරු දුන්හ.
"එසේ නම් තොප හැම දෙනා අතුරින් එක් අයෙකුගේ හෝ වැසි සහිත සුළඟක් ඇගේ වැදුණේ ද?"
"නැත ස්වාමීනි, " යි ඔවුහු පිළිතුරු දුන්හ.

"විදුලිය කොතෙක් දුරට පෙනේ ද?" යි නැවත ගැල් නායකයා විමසී ය.
"සතර පස් යොදුනක් දුරට පෙනේ" යැයි පිරිස කිවූහ.
"තොපගෙන් කිසිවෙක් එවැනි විදුලි ආලෝකයක් දුටුවේ ද?"
"නැත ස්වාමීනී, එවැනි ආලෝකයක් නුදුටුම්හ"යි ඔවුහු කීහ.

"ගෙරවිලි හඬ කොතෙක් දුරට ඇසෙන්නේ දැ?" යි විමසූ විට යොදුනක් පමණ දුර ඇසෙන බව ඔවුහු කීහ.
"තොප අතුරින් කිසිවකුට එවැනි ගෙරවිලි ශබ්දයක් ඇසුණේ ද?" යි විචාළේ ය.
"නැත ස්වාමීනී, එවැනි ගෙරවිලි හඬක් නොඇසුණේ ය" යි පිරිස කීහ.

එවිට බෝසතාණෝ "පින්වතුනි, මොවුහු මිනිස්සු නොවෙති; යක්ෂයෝ ය. මොවුන් අප ගෙන යන ජලය ඉවත් කර අපව දුර්වල කොට මරා කෑමට පැමිණි යක්ෂයන් පිරිසකි. අපට පෙර ගිය ගැල් නායකයා උපාය දන්නේ නැත. ස්ථිර වශයෙන් ම ඔහු රවටා ජලය ඉවත් කරවා පීඩාවට පත්කොට මරා කන්නට ඇති. බඩු පිරවූ ගැල් අපට දැක ගන්නට හැකි වේවි. ඒ නිසා ජල බිඳක්වත් ඉවත නොදමා ඉක්මනට ගැල් පදවන්නැ'යි උපදෙස් දුන්හ.

ගැල් කණ්ඩායම ඉදිරියට යද්දී බඩු පුරවන ලද ගැල් පන්සියය හා යක්ෂයින් විසින් කා දමන ලද මිනිසුන්ගේ හා ගවයින්ගේ ඇටකටු දැක ගැල් නතර කොට ගොනුන් ලිහා ගැල් වළල්ලක් සේ රඳවනු ලැබිණ. කඳවුරු බැඳ වේලාසනින් ම ගවයින්ට තණකොළ කවා මිනිසුන්ට බත් කෑමට නියම කර මිනිසුන් මැදිවන සේ ගොනුන් වටේට ම තැබිණ. මිනිසුන්ට නිදා ගැනීමට සලස්වා ශක්තිමත් පුද්ගලයන්ට කඩු මුගුරු ආදිය අතට දී රාත්‍රිය මුළුල්ලේ ම ආරක්ෂාව සලස්වන ලදි.


ඔවුහු දෙවැනි දින උදෑසන ම ගවයින්ට තණකොළ කෑමට දී තම පරණ ගැල් ඉවත්කර කලින් පැමිණි කණ්ඩායමේ ශක්තිමත් ගැල් ඒ වෙනුවට යොදා ගත්හ. අගයෙන් අඩු භාණ්ඩ ඉවත් කර අගය වැඩි වටිනා බඩු කරත්තවලට දමා ගත්තෝ ය. මිනිස් වාසයට පැමිණි ඔවුහු රිසි සේ මිල නියම කොට බඩු විකුණා සමෘද්ධියට පත් වූහ.

මෙම ජාතක කථා වස්තුවෙන් වෙළෙඳ කණ්ඩායම් නායක චරිත දෙකක් පිළිබිඹු වේ. අනුවණකමින් තීන්දු තීරණ ගත් නායකයාත්, දූර දක්නා නුවණින් කටයුතු කළ නායකයාත් ඒ චරිත දෙකයි. අඥාන සාත්තු නායකයා ගත් ක්ෂණික තීරණ නිසා ඒ වෙළෙඳ කණ්ඩායම විනාශයට පත් විය. නමුත් දූර දක්නා උපායශීලී නුවණින් යුතු අප මහ බෝසතාණන් වහන්සේගේ වෙළෙඳ කණ්ඩායම ජීවිත ද බේරා ගනිමින් සමෘද්ධිමත් වෙළෙඳුන් බවට පත් වූහ.

මෙම කථා පුවතින් අපට චරිතායනය කර ගත හැකි නායකත්ව ගුණාංග රැසක් ඇත. ඒවායින් කිහිපයක් පහත සඳහන් වේ.

- දූර දක්නා නුවණින් යුක්ත බව
- පූර්ව සූදානම හා සැලසුම් සහගත බව
- ඉවසිලිමත් හා විමසිලිමත් බව
- අනුගාමිකයන්ට පිළිගත හැකි විශ්වාසදායක අයකු වීම
- සහයෝගයෙන් කටයුතු කිරීමේ හැකියාව
- නිවැරැදි තීරණ ගැනීම
- නොබිය ව ක්‍රියා කිරීම
- සංවිධාන ශක්තියෙන් යුතු වීම
- අනුගාමිකයන්ගේ ආරක්ෂාව සැලසීම
- වගකීමෙන් හා වගවීමෙන් යුක්ත බව

එසමයෙහි නුවණැති සාත්තු නායකයා ව ඉපිද සිටියේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ ය. පළමු ව ගොස්, අපරීක්ෂාකාරී වීම නිසා විනාශ මුඛයට පැමිණියේ දෙව්දත් තෙරුන් ය. මෙම කතා පුවත එන්නේ පන්සිය පනස් ජාතක පොත් වහන්සේට ඇතුළත් අපණ්ණක ජාතකයෙහි ය.



## සාරාංශය

★ අඥාන වෙළෙඳ නායකයකුගේ ක්‍රියා කලාපය නිසා විනාශ මුඛයට පත් වෙළෙඳ කණ්ඩායමක් හා නායකයා ඥානවන්ත ව කටයුතු කිරීමෙන් සමෘද්ධියට පත් වූ වෙළෙඳ කණ්ඩායමක් පිළිබඳ ව අපණ්ණක ජාතක කථාවෙන් විස්තර වේ.

★ මෙම කතා පුවත ඇසුරින් සැලසුම් සහගත බව, සූදානම, දුර දක්නා නුවණ, තම පිරිස සමග නිරන්තර සංවාද තුළින් අරමුණු කරා යාම, පිරිස් කළමනාකරණය, විමසිලිමත් බව, නිවැරැදි ම තීරණ ගැනීම, එඩිතර බව, සුහදශීලී බව ආදි නායකත්ව ගුණාංග රැසක් අපට ජීවිතාදර්ශ කර ගත හැකි ය.



## ක්‍රියාකාරකම

1. ශිෂ්‍ය නායක නායිකාවන්ට හා පන්ති නායක නායිකාවන්ට මෙම කථා පුවතින් එක් කරගත හැකි ජීවිතාදර්ශ පහක් ලියන්න.

2. අපණ්ණක ජාතකයේ පළමු ඡේදය ජාතක දේශනා ශෛලියෙන් සජ්ඣායනා කරන්න.



## පැවරුම

අපණ්ණක ජාතකය ඇසුරින් කෙටි නාට්‍ය පිටපතක් සකස් කර රඟ දක්වන්න.